17.07.2019
Learning Resource Center
R
De Mazenod College
Kandana

ද මැසිනොද් විදුහල

අ.පොස.උසස් පෙළ විභාගය අවසාන වාර පරීක්ෂණය

පෙරදිග සංගීතය - I කොටස කාලය පැය 02

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. භාරතීය සංගීතයේ ක්‍රම විකාශනයට අනුව හින්දුස්ථානි සංගීතයේ ස්වර්ණමය යුගය ලෙස.සැලකෙන යුගය වන්නේ

   1. වෛදික යුගය 2. මෝගල් යුගය 3. හින්දු යුගය 4. ඉංග්‍රීසි යුගය

2. ආධුනිකයෙකුට නිවැරදිව ශ්‍රැතියේ පිහිටා ගායනා කිරීමේ හැකියාව වර්ධනය කර ගැනීමට වඩාත් යෝග්‍ය අභ්‍යාස වන්නේ

   1. ස්වසන අභ්‍යාස 2. තාල අභ්‍යාස 3. ස්වර අභ්‍යාස 4. ගමක් අභ්‍යාස

3. ගාන සමය පිළිබඳ විග්‍රහ කිරීමේදී දිනය ප්‍රහාර කීයකට බෙදා දක්වා ඇත්ද

   1. දෙකකට 2. අටකට 3. තුනකට 4. හතරකට

4. මධ්‍යහන 12 සිට මධ්‍යම රාත්‍රිය දක්වා ගානසමය යෙදෙන රාග හඳුන්වන්නේ

   1. උත්තරංග වාදී රාග 2. සංධි ප්‍රකාශ රාග 3. පූර්වංග වාදී රාග 4. සම ප්‍රකෘති රාග

5. රාත්‍රි 12 සිට මධ්‍යහන 12 දක්වා ගානසමය යෙදෙන රාග හඳුන්වන්නේ

   1. උත්තරංග වාදී රාග 2. පූර්වංග වාදී රාග 3. සම ප්‍රකෘත රාග 4. සංධි ප්‍රකාශ රාග

6. බහුල වශයෙන් ස්වර මත ලෙලවීම

   1. ගමක් 2. මීන්ඩ් 3. මුර්කි 4. ආන්දෝලන

7. ප්‍රධාන ස්වරය ගයනා කිරීම පිණිස තවත් සවරයක හඬ සියුම් ලෙස ස්පර්ශ කිරීම

   1. මීන්ඩ් 2. ආන්දෝලන 3. කන් 4. මුර්කි

8. එක් සවරයක සිට තවත් ස්වරයකට හඬ නොනවත්වා ගමන් කිරීම

   1. ගමක් 2. මුර්කි 3. මීන්ඩ් 4. ආන්දෝලන




9. ජෞනපූරි රාගයේ සම ප්‍රකෘත රාගය වන්නේ

   1. දේශ් 2. තිලක්කමොද් 3. ආශාවරි 4. ජයජයවන්ති

10. රි සහ ප වාදී සංවාදී වන රාග යුගලය වන්නේ

    1. දේශ් - තිලක්කාමෝද් 2. ආශාවරි - ජෞනපූරි

    3. භාගේශ්‍රි - මාල්කෞන්ස් 4. ජයජයවන්ති - හංසධ්වනි

| A | B | C | D | E |
|---|---|---|---|---|
|  |  |  |  |  |

❖ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට ඉහත වගුව උපයෝගී කරගන්න.

11. උස්තාද් අල්ලා රක්ඛා සංගීතඥයා ප්‍රවීනත්වයක් උසුලන සංගීත භාණ්ඩය කුමක්ද?

1.B 2.A 3.D 4.C

12. පණ්ඩිත් හරි ප්‍රසාද් චෞරසියා සංගීතඥයා ප්‍රවීනත්වයක් උසුලන සංගීත භාණ්ඩය කුමක්ද?

1.C 2.A 3.E 4.D

13. ශාස්ත්‍රීය සංගීතයේදී ශ්‍රැතිය පවත්වා ගැනීමට යොදාගන්නා සංගීත භාණ්ඩය වනුයේ

1.E 2.C 3.B 4.D

14. ජනප්‍රිය සංගීතය(popular music) සඳහා තම සංගීත භාණ්ඩය මහඟු ලෙස උපයෝගී කරගත් හින්දුස්ථානි සංගීතඥයා වන්නේ

1. භාත්ඛන්ඩේ පඬිතුමා 2. පණ්ඩිත් රවිශංකර් 3. අමීර් කුශ්රු 4.ශාන්ති ගීත දේව

15. හින්දුස්ථානි සංගීතයට බටහිරින් ආගමනය වූ සංගීත භාණ්ඩය කුමක්ද?

1.B 2.C 3.D 4.E

16. 7/8 රිද්මයට වාදනය කල හැකි හින්දුස්ථානි තාල යුගලය වන්නේ

1.දීප්චන්දී - ජප් 2.ත්‍රිතාල් - තිලවාඩා 3.දීප්චන්දී - රූපක් 4.එක්තාල් - තිලවාඩා

17. බහුවිධ බුද්ධිය(multiple intelligence) පිලිබඳ සිද්ධාන්තය ඉදිරිපත් කළ ඇමරිකානු මනෝ විද්‍යාඥයා කවුද?

1.ප්ලේටෝ 2.ජින් පියාජේ 3.සිග්මන් ෆ්‍රොයිඩ් 4.හොවාර්ඩ් ගාඩ්නර්

18. කර්ණාටක සංගීත පද්ධතියට ආවේණික වූ රාගයකි.

1. හංසධ්වනි 2. ජයජයවන්ති 3. පූර්වී 4. මාර්වා

19. දුරස් වන්නට මේ ලෙසින් ගීතය කුමන රාගය ආශ්‍රිතව නිර්මිතද ?

1. තිලක්කමෝද් 2. කිර්වාණි 3. පිළු 4. කලාවතී

20. ස රි රි , රි ග රි ස , යනුවෙන් සංගති යෙදෙන රාගය

1. අශාවරි 2. කාලිංගඩා 3. ජයජයවන්ති 4. හංසධ්වනි

21. රාග ගාන සමය තීරණය කිරීමේදී අධ්ව දර්ශක නැතහොත් සමය දර්ශක ස්වරය ලෙස හැඳින්වෙන්නේ

1. ස ස්වරයයි 2. ග ස්වරයයි 3. ම ස්වරයයි 4. නි ස්වරයයි

❖ පහත දැක්වෙන්නේ බටහිර සංගීතයේ ප්‍රස්ථාරකරණයේදී යොදාගන්නා ප්‍රකාශන සංකේතවලට අදාළ ප්‍රකාශයන්ය.

a. මෙම සංකේතය ඇති තැන ඉතා අඩුවෙන් වාදනය හෝ ගායනය කළ යුතුය.

b. මෙම සංකේතය ඇති තැන ඇති ස්වර හඬ තරමක් අඩුවෙන් වාදනය හෝ ගායනය කළ යුතුය.

c. මෙම සංකේතය ඇති තැන ඇති ස්වර තරමක් හඬ වැඩියෙන් වාදනය හෝ ගායනය කල යුතුය.

d. මෙම සංකේතය ඇති තැන ඇති ස්වර වල හඬ ඉතා වැඩියෙන් වාදනය හෝ ගායනය කළ යුතුය.

❖ ඉහත ප්‍රකාශ අතුරින් 22 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

22. a ප්‍රකාශය සඳහා යොදාගනු ලබන සංකේතය හා ඊට අදාළ නාමය……………… වේ.

23. b ප්‍රකාශය සඳහා යොදාගනු ලබන සංකේතය හා ඊට අදාළ නාමය……………… වේ.

24. c ප්‍රකාශය සඳහා යොදාගනු ලබන සංකේතය හා ඊට අදාළ නාමය……………… වේ.

25. d ප්‍රකාශය සඳහා යොදාගනු ලබන සංකේතය හා ඊට අදාළ නාමය……………… වේ.

❖ පහත සඳහන් ගී පාද ඇසුරින් 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. භානු සේ ගී මා සඳ දිය

B. අපගේ මුනි රජාණන්

C. සුරඳුන් පෙර සිටන්

D. අට්ය වඩන තෙද අනසක

E. ගුණ දැතේ බෝසත් අතේ පෙර

26. කෝට්ටේ යුගයේ ආරම්භ වී මහනුවර යුගයේ ප්‍රචලිත වූ ගී වර්ගයකි.

1. A 2. B 3. C 4. D

27. සුළු මහා දෙතිතට අනුව ගැයෙන ගී පාදයකි.

1. B 2. D 3. E 4. C

28. D සහ E ට අදාල ගී පාදයක් අයත් වනුයේ.

1. සේ ගී ගණයට 2. ශාන්ති කර්ම ගී ගණයට 3. වන්නම් වලටය 4. අස්නේ වලටය

29. C ගී පාදය අයත් වන වන්නම

1. උකුසා වන්නම 2. කෝකිල වන්නම 3. ගණපති සවුදම් 4. සැවුලා වන්නම

30. B ගී පාදයට අයත් ශෛලියට අනුව නිර්මාණය වූ ගීතයකි.

1. සැදෑ කළුවර 2. ඔබයි රම්‍ය 3. මන්නාරම් කන්තාරමේ 4. මම දෙව්දූනි

❖ 31 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න.

(චෛකොව්ස්කි, ආචාර්ය ප්‍රේමසිරි කේමදාස, නාඩගම්, කෝලම්, ධ්‍රැපද්, ධමර් තාලය, මාල්කෞන්ස් ගැල් ගී, සරස්වතී මණ්ඩපය, භාගේශ්‍රී)

31. ලොව පැරණිතම හින්දුස්ථානි ගායන ශෛලිය........................ වේ.

32. පක්වාජය..................... සහ චෞතාලය වාදනය කිරීමට යොදා ගනු ලබයි.

33. අනාඝාතාත්මක ගී ගණයට අයත් වුවද අඝාතාත්මකව ගැයිය හැකි.................... ගී වර්ගයකි.

34. හංසරාජිනී ගීතය......................... රාගයට අනුව නිර්මාණය වී ඇත.

35. පොතේ ඉත්තිසය, තෝඩායම වැනි ලක්ෂණ ඇතුලත් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලිය ......................... වේ.

36. වෙස් මුහුණු පැළඳගෙන රඟ දක්වන රංග සම්ප්‍රදාය වන්නේ .........................

37. මානස විල නිර්මාණය කරනු ලැබුවේ.......................... විසිනි.

38. Swon Lake මුද්‍රා නාට්‍ය නිර්මාණය කල සංගීතඥයා වන්නේ.......................ය.

39. ශ්‍රී ලාංකේය රාජ සභා සංගීතය සමග වඩාත් වැදගත් තැනක් ගන්නා.................... පැවතියේ පොළොන්නරු යුගයේය.

40. රාග ජාතිය පිලිබඳ විවිධ මත ඵල වී ඇති රාගය වන්නේ ......................රාගයයි.

❖ 41 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

41. චතුර්වේද අතරින් සංගීතය හා සම්බන්ධ වන වේදය කුමක්ද? ..................

42. වෛදික ස්වර තුන උදාත්ත , අනුදත්ත සහ ..................වේ.

43. වර්තමාන ඉන්දියානු සංගීත අධ්‍යාපනය විධිමත් කල පඬිතුමා කවුද? ..................

44. එතුමා විසින් රචිත ග්‍රන්ථය කුමක්ද? ..................

45. කොරල් සිම්ෆනිය කාගේ නිර්මාණයක්ද? ..................

46. මැජික් ෆ්ලූට් කාගේ නිර්මාණයක්ද? ..................

47. බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයට අදාළ ප්‍රධාන කොටස් 3ක ලියා දක්වන්න.

......................................................................................................

......................................................................................................

48. බටහිර සංගීතයේ ප්‍රධාන හැඩතල හතර ලියා දක්වන්න.

......................................................................................................

......................................................................................................

49. වයලින් පවුලට අයත් භාණ්ඩ ලියා දක්වන්න.

......................................................................................................

......................................................................................................

50. මැදුම් මහා දෙතිතට සමාන හින්දුස්ථානි තාලය කුමක්ද?..................

17.07.2019

ද මැසිනොද් විදුහල

අ.පො.ස.උසස් පෙළ විභාගය    අවසාන වාර පරීක්ෂණය

පෙරදිග සංගීතය - II කොටස    කාලය පැය 03

I කොටසින් ප්‍රශ්න 2 ක් ද, II කොටසින් එක් ප්‍රශ්නයක් ද, III කොටසින් ප්‍රශ්න 2 කට ද වශයෙන් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i). පහත සඳහන් ස්වර සංගතින් අයත් වන රාග හඳුනාගෙන නම් කරන්න.

    a) ම ගු රි ස , නි ධ ස , ස ම , ම ගු

    b) ස රි ම ප , ම ප , ධු ධු ප ම ප , ගු

    c) ම ප , නි ධ ප ධ , ම ග රි

    d) නි ස , ධ නි රි , ග ම ප , ග ම , රි ගු රි

    (ii). වාදී ම සංවාදී ස ලෙස යෙදෙන රාගයක ථාටය,ජාතිය, ආරෝහණ - අවරෝහණ,ගානසමය, මුඛ්‍යාංගය යන රාග විස්තර ලියන්න.

    (iii). ඉතිරි රාග 3න් එක් රාගයකට අයත් මාධ්‍යලය ගීතයක් හා තානාලංකාර 3 ක් ලියා දක්වන්න.

2. (i). සම ප්‍රකෘති රාග යනු කවරේද? සැකෙවින් හඳුන්වන්න.

    (ii). දේශ් තිලක්කාමෝද් - ආශාවරි - ජෞනපුරි , භෛරව - කාලිංගඩා යන රාග අතුරින් එක් රාග යුගලයක සමානතා 3ක් ද අනෙක් රාග යුගලයේ අසමානතා 3 ක් ද ලියන්න.

    (iii). දේශ් තිලක්කාමෝද් යන රාග අතුරෙන් එක් රාගයකට අදාළ වන පරිදි ස්වර 30 කට නොඅඩු ආලාප ඛණ්ඩයක් ලියා දක්වන්න.

    (iv). ආලාප වර්ග හා තානාලංකාර වර්ග 2 බැගින් නම් කරන්න.

3. (i). ස , නි රි ග ප රි , ස , ග රි නි ප යන ස්වර සංගතය ඇතුලත් රාගය හඳුනාගෙන එහි රාග විස්තර ලියා දක්වන්න.

    (ii). ඉහත රාගයට අදාළ මධ්‍යලය ගීතයක ස්ථායි කොටස ලියා දක්වන්න.

    (iii). එම රාගයට අදාළ ස්වර අභ්‍යාසයක් ලියා දක්වන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana

## II කොටස

A ගීතය

B ගායන ශෛලිය / රංග ශෛලිය

a) ශ්‍යාමේ හම්

b) චාන්දී පෛසා රංග

c) තුමත චලිත රාම චන්ද්‍ර

d) පායෝජී මෛනෙ

e) ගම්බිර තෙදැති

f) උත්තම චන්ලොච

g) භානු සේගී මා සඳ දිය

h) සෝබමාන දේව පුරා

4.(i). ඉහත A කොටසෙහි a - h දක්වා ඇති ගීත අයත්වන ගායන ශෛලින් / රංග ශෛලින් පිළිවෙලින් B කොටසෙහි ලියා දක්වන්න.

(ii). ඉහත ගායන ශෛලින් 2 ක් පිළිබඳව විස්තර කරන්න.

(iii). ඉහත රංග ශෛලින් 2 ක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

5. A- සංධ්වනි B- කාරණා C- ප්‍රශස්ති

(i). ඉහත මාතෘකා අයත් සංගීත පද්ධතීන් පිළිවෙලින් නම් කරන්න.

(ii). සංධ්වනි යන්න කෙටියෙන් හඳුන්වා එහි විශේෂ ලක්ෂණ 5ක් ලියා දක්වන්න.

(iii). ඉහත C මාතෘකාවට අයත් ගීතයක ස්වර ප්‍රස්ථාරයක් ලියන්න.

(iv). ප්‍රශස්ති පිළිබඳව කෙටි විස්තරයක් ලියා දක්වන්න.

(III) කොටස

පහත දැක්වෙන්නේ නිර්දේශිත තාල පහකට අයත් තොරතුරු සහිත වගුවකි.

| අවනද්ධාක්ෂර | තාලයේ නම | මාත්‍රා ගණන | තාල සංකේත | තාල වාද්‍ය භාණ්ඩ |
|---|---|---|---|---|
| A. තිට කත ගධී ගෙන | a .......... | 12 | X 02034 | පක්වාජ් |
| B. ධා ධා තිං තිං | b ........... | 16 | X 203 | තබ්ලාව |
| C. ධාගෙ තිරිකිට | c ........... | 12 | d ........... | e ........... |
| D. කධිට | f ........... | g ........... | h ............ | i ............ |

6. (i). ඉහත වගුව සම්පූර්ණ කරන්න.

(ii). ඉහත තාල අතුරින් විභාග වල මාත්‍රා විෂමව යෙදෙන තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(iii). A සහ C තාලයන්හි සමානතා ලියා දක්වන්න.

7. (a). ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතය

(b). ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

(c). ශ්‍රී ලංකාවේ නාට්‍ය විකාශනය යන මාතෘකා අතරින් මාතෘකා 2ක් පිළිබඳව විස්තර කරන්න. (නිදසුන් සහිතව ) පහත සඳහන් කරුණුද මේ සඳහා අන්තර්ගත කරන්න.

- ආරම්භය
- අනුකාරක තනු
- ස්වතන්ත්‍ර නිර්මාණ
- ගායනා කළ කණ්ඩායම් හෝ ගායන ශිල්පින් ශිල්පිනියන්

8. ධ - ස ස /ස - ත්‍රි ස /රි රි ප ප/ ග - ග - / රි ග ම ප / ග - රි - / ස - - - / - - - - /

(i). ඉහත ප්‍රස්ථාරය බටහිර ක්‍රමයට ප්‍රස්ථාර කරන්න.

(ii). ඉහත ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න.

(iii). මධ්‍යම භාවයට සැකසූ ප්‍රස්ථාරයට අදාළ වන ලෙස chords නිර්මාණය කරන්න.